# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## 13 ශ්‍රේණිය - චිත්‍ර කලාව I

## I – කොටස

**කාලය පැය 3**

- **ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුරට අයත් තිත් ඉරිමත ලියන්න. ඒ සඳහා A B C D E යන රූප සටහන් උපයෝගී කරගන්න.**


A


B


C


D


F

1) ශ්‍රී ලංකාවේ දැකිය හැකි සුවිශේෂී ගෘහ නිර්මාණයක් A අක්ෂරයෙන් දක්වේ. එය.
   1. අනුරාධපුර රන්මසු උයනේ දකිය හැකි පටිමාඝරය වේ.
   2. පොළොන්නරු නටඹුන් අතර හමු වූ පිළිම ගෙයකි.
   3. පුළුකුණාව ආසනඝරය සහිත නටඹුන් අතර දකිය හැකි ස්මාරකයකි.
   4. නිශ්ශංකමල්ල රජතුමා සිහිවීමට තැනූ ස්මාරකයකි.
   5. මහනුවර මඟුල් මඩුව දකිය හැකි ගෘහ නිර්මාණයකි. (......)

2) B ක්ෂරයෙන් දක්වෙන්නේ විශිෂ්ට වා කවුළු සහිත ගෘහ නිර්මාණයක කොටසකි. එය හමුවන්නේ,
   1. යාපහුව නටඹුන් අතුරිනි
   2. මහාමෙව්නා උයනේ නටඹුන් අතුරිනි
   3. දිඹුලාගල මරා වීදියේ ගෘහ නිර්මාණ අතුරිනි.
   4. පොළොන්නරු ථූපාරාම විහාර ගෙය ආශ්‍රිතවය
   5. අනුරාධපුර දුටුගැමුණු මාළිගය ආශ්‍රිත නටඹුන් අතුරිනි. (......)

3) කුඩා ස්ථූප කිහිපයක් සහිත වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් C අක්ෂරයෙන් දක්වේ. එය හඳුන්වන්නේ,
   1. ස්ථූප වටා ඇති ථූපඝරයක් ලෙසට ය.
   2. ලෙන් විහාරයක් ආශ්‍රිත කුටියක් ලෙස ය.
   3. ගිංජිකාවසත ලෙස ය.
   4. මණ්ඩපම් යනුවෙනි.
   5. ගඩලාදෙණි විජයොත්පාය ලෙස ය. (......)

4) ගම්පල යුගයට අයත් ගල් තලාවක් මත ඉදි වූ සුප්‍රසිද්ධ විහාරස්ථානයක් D අක්ෂරයෙන් දක්වේ. එය
   1. රිදී විහාරයයි.
   2. මැදවල විහාරයයි.
   3. මුතියංගන විහාරයයි.
   4. ලංකාතිලක විහාරයයි.
   5. තන්තිරිමලේ විහාරයයි. (......)

5) E අක්ෂරයෙන් දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ දකිය හැකි වෙනස් වූ ආකාරයක ගෘහ නිර්මාණයකි. එය දකිය හැක්කේ,
   1. රුවන්වැලි දාගැබ ආශ්‍රිතව ය.
   2. ඇඹැක්ක දේවාලය ආශ්‍රිතවය ය.
   3. දළදා මාළිගය ආශ්‍රිතව ය.
   4. තෙල්වත්ත විහාරය ආශ්‍රිතවය ය.
   5. මහනුවර ත්‍රිත්ව දෙව් මැදුර ආශ්‍රිතව ය. (......)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට අයත් අංකය තිත් ඉරි මත ලියන්න.**

6) ජෝර්ජ් බ්‍රාක් නම් වූ ඝණිකවාදී චිත්‍ර ශිල්පියාගේ හොඳම සිතුවමක් වන්නේ,

1. සංගීතඥයින් තිදෙනා නැමැති චිත්‍රය යි.
2. හිරු පායා නමැති චිත්‍රය යි.
3. නිවාස සහ ගස් නැමැති චිත්‍රය යි.
4. සෙන්සියෝ නමැති චිත්‍රය යි.
5. නොමියෙන මතකය නමැති සිතුවමයි. (......)

7) ''නිවසක් තුළ සිටින මිනිසුන් දෙදෙනා'' නැමැති ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් චිත්‍රය හමුවන්නේ,

1. තන්තිරිමලේ ගුගාවෙනි.
2. බිල්ලෑව ගුගාව ආශ්‍රිතවය.
3. වෙට්ටුම්බුගල ගුහා ආශ්‍රිතවය.
4. දොරවක ලෙනෙනි
5. කුරුන්දක ලෙනෙනි. (......)

8) ශ්‍රී ලංකාවේ පැරණිතම වටදාගෙය ලෙසට සැලකෙන්නේ,

1. අනුරාධපුර ලංකාරාම වටදාගෙයි.
2. අත්තනල්ල වටදාගෙය යි.
3. කළුතර වටදාගෙය යි.
4. ථූපාරාම වටදාගෙයි.
5. හඟුරන්කෙත වටදාගෙය යි. (......)

9) ''පූජකරුව' නම් වූ කුඩා ප්‍රමාණයේ හුණු ගලින් කළ මූර්තියක් හමු වී ඇත්තේ,

1. දෙගම්මැදි ශිෂ්ටාචාරට හෙවත් බැබිලෝනියානු ශිෂ්ටාචාරයෙනි.
2. යුරෝපයේ විශිෂ්ට සංස්කෘතියක් වූ මායා ශිෂ්ටාචාරයෙනි.
3. අසිරිමත් කලා කෘති රැසක් බිහිකළ රෝම සංස්කෘතියෙනි.
4. ඉන්දියාවේ කාර්ලේ ගුහා ආශ්‍රිතවය.
5. වසර පන්දහසක් පමණ පැරණි මොහෙන්ජොදාරෝ - හරප්පා ශිෂ්ටාචාරයෙනි. (......)

10) වර්ණවත් වීදුරු ගල් අල්ලා කළ කිතුනු ආගම හා සබැඳි චිත්‍ර රාශියක් හමුවන්නේ,

1. බයිසන්තියානු කලාව තුළිනි
2. ඩඩයිවාදය තුළිනි.
3. බැරොක් කලාව තුළිනි
4. ඊජියන් කලාව තුළිනි.
5. සුරෙයිවාදය තුළිනි. (......)

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන** F, G, H, I, J **රූප සටහන් උපයෝගී කරගන්න.**
- 


F


G


H


I


J

11) F අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ දැකිය හැකි විශිෂ්ටතම කැටයමකි. ඒ තුළින් නිරූපණය වන්නේ,

1. යුදයට ගිය සෙබලෙකු ඇතුළු පිරිස යයි මතයකි.
2. දුටුගැමුණු රජ හා පවුල යන මතයයි.
3. රාජ සභාවක දර්ශනයක් යයි ද මතයකි.
4. ඉන්දියාවේ රාජේශ්වර් කෝවිලෙන් මෙහි ගෙනා එලයක් යයි මතයකි.
5. දේව සභාවක් යයි මතයකි. (......)

12) G අක්ෂරයෙන් දැක්වෙන කැටයම හමුවන්නේ,

1. භාරතයේ අමරාවතී කලාව ආශ්‍රිතව ය.
2. සාංචි විහාරාරාම සංකීර්ණය ආශ්‍රිතව ය.

3. භාරුත් ගල් වැට ආශ්‍රිතවය ය. 4. වැල්ලේ දේවාලය ආශ්‍රිතවය.
5. හරප්පා ශිෂ්ටාචාරය ආශ්‍රිතවය. (......)

13) යුගයෙන් යුගය වෙනස්කම්වලට ලක් වූ සඳකඩ පහනේ එක් උච්ඡ අවස්ථාවක් H අක්ෂරයෙන් දැක්වේ. මෙම සඳකඩ පහන හමුවන්නේ,
1. අනුරාධපුර බිසෝ මාළිගය අසලිනි. 2. නිශ්ශංක ලතා මණ්ඩපය ගොඩනැගිල්ල තුළිනි.
3. පොළොන්නරු වටදාගෙය තුළිනි. 4. දෙගල්දොරු ලෙන් විහාරය අසලිනි.
5. මහනුවර දළඳා මාළිගය ආශ්‍රිතවය. (......)

14) I අක්ෂරයෙන් දැක්වෙන කැටයම නම් කර ඇත්තේ,
1. දුර්ගා විසිනි මී ගව යක්ෂයන් පලවා හැරීම යනුවෙනි.
2. රාවණා විසින් කෛලාසකූඨය සෙලවීම යනුවෙනි.
3. රජවරුන් යුධ ජයග්‍රහණ යනුවෙනි.
4. සාංචි තොරණ කැටයම යනුවෙනි.
5. රාම සීතා කතා පුවත යනුවෙනි. (......)

15) J අක්ෂරයෙන් දැක්වෙන කැටයම හමුවන්නේ,
1. පොළොන්නරු වටදාගෙය පියගැට පෙළ තුළිනි.
2. ගම්පොල යුගයට අයත් ඇම්බැක්ක දේවාල කණුවකිනි.
3. එල්ලෝරාවේ 10 වන ගුගාවෙනි
4. අභයගිරි විහාර භූමිය ආශ්‍රිතව ය.
5. කුරුණෑගල රීදි විහාරයේ ලෙන තුළිනි. (......)

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

16) උද්‍යාන මූර්තියක් නිර්මාණය කිරීමේදී නිර්මාණ ශිල්පියා වඩාත් සැලකිලිමත් විය යුත්තේ,
1. පිරිවැය, සමබරතාව සහ හැඩකල පිළිබඳව ය.
2. මාධ්‍ය, අඩු වියදම සහ සරල බව පිළිබඳවය ය.
3. අවකාශය, ස්ථානයට උචිත පරිමාණ සහ අමුද්‍රව්‍ය පිළිබඳව ය.
4. සමබරතා, පල්ප භාවිතය සහ ජ්‍යාමිතික හැඩතල පිළිබඳව ය.
5. ශෛලිගත බව, ව්‍යුක්ත හැඩ ගැලපීම සහ අවකාශය පිළිබඳව ය. (......)

17) පොස්ටර් චිත්‍රයක් නිර්මාණය කිරීමේදී අවධානය යොමුකළ යුතු අංශ වන්නේ,
1. ප්‍රමාණය, අඩු වර්ණ භාවිතය සහ මාතෘකාව
2. අඩු පිරිවැය, අක්ෂරකරණය සහ ගැළපෙන හැඩතල
3. මානව රූප පරිමානුකූලව යෙදීම, උචිත වර්ණ සහ සංරචනය
4. අදාළ පණිවුඩය ග්‍රාහකයාට ඉක්මණින් ග්‍රහණය කරගත හැකි බව, උචිත හැඩතල සංචරනය සහ ආකර්ශනීය බව.
5. මාතෘකාවට උචිත බව, ග්‍රාහක රුචිකත්වය සහ අක්ෂරකරණය. (......)

18) සඳ පායා, නම් නොකළ ආදී ව්‍යුක්ත රූපික සිතුවම් නිර්මාණය කළ ශිල්පියා වන්නේ,
1. එච්.ඒ. කරුණාරත්න මහතා ය. 2. ස්ටැන්ලි අබේසිංහ මහතාය.
3. එස්.පී. චාල්ස් මහතා ය. 4. හැරී පීරිස් මහතාය.
5. අයිවර් පීරිස් මහතාය. (......)

19) 'විවේක ගන්නා බයිසන් ගවයා' නැමැති ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම හමු වන්නේ,
1. ප්‍රංශයේ ෂෝවේ ගුහාවෙනි. 2. ස්පාඤ්ඤයේ අල්ටමීරා ගුහාවෙනි.
3. ස්පාඤ්ඤයේ කෝගුල් ගුහාවෙනි. 4. ප්‍රංශයේ පොන්ට්ද්‍යුගෝමෙ ගුහාවෙනි.
5. ප්‍රංශයේ ලැස්කෝ ගුහාවෙනි. (......)

20) ''සාලබංජිකා'' නමැති මූර්තිය හමුවන්නේ,
1. විහාරස්ථානවල ඉදිකර ඇති මකර තොරණ තුළිනි. 2. අජන්තාවේ 17වන ගුහාව තුළිනි.

3. රාජ රාජපේෂ්වර දේවාලය තුළිනි.    4. මාමල්ලපුරම් කැටයම් අතුරිනි.
5. සාංචි තොරණවල කණු ආශ්‍රයෙනි.    (......)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා පිළිතුරු සැපයීමේදී ඉදිරියේ ඇති ඡායාරූප ඇසුරු කර ගන්න.**

21) ඉදිරියෙන් දැක්වෙන නටරාජා මූර්තිය තුළින්,



1. විශ්වයේ පැවැත්ම හා විනාශය නිරූපනය වන බවට අදහසක් පවතී.
2. ගංගා නම් ගඟෙහි ආරම්භය සනිටුහන් කරන බවට ද මතයකි.
3. පාර්වතිය ඉදිරියේ විශිෂ්ට රංගනයක යෙදෙන ශිව දෙවියන්ගේ අනුරුවක් යයි ද මතයකි.
4. මුයලමන නම් වාමනයා මර්දනය කිරීම යයි අදහසක් පවතී.
5. පැරණි දේව කතාවක එක් චරිතයක් නිරූපණය වන බවට මතයකි. (......)

22) ඉපැරණි සංස්කෘතියකින් හමු වූ විශිෂ්ට මූර්තියක් දැක්වේ. එය,



1. කාන්තා ලාලිත්‍ය  නිරූපනය කිරීම පිළිබඳ පුනර්ජීවන යුගයේ සිටි මූර්ති ශිල්පියාගේ පරිණත බව විදහාපෑමකි.
2. ග්‍රීසියේ සිටි විශිෂ්ට මූර්ති ශිල්පියෙකු වූ ඇන්ටියොච්ගේ විනස් දී මේලෝ යනුවෙන් නම් කර ඇති මූර්තියයි.
3. රෝම කලා කෘතියකින් පිටපත් කර ගත් කිරිගරුඬ මූර්තියකි.
4. කණ්ණාඩියක් තම සිරුර නරඹන මිසර අධිරාජිනයකගේ තිවංක මූර්තියකි.
5. මයිරන් නම් වූ ග්‍රීක මූර්ති ශිල්පියාගේ අග්‍රහණ්‍ය නිමැවුමකි.
(......)

23) පැරණි ශිෂ්ටාචාරයකින් හමු වූ කුඩා මූර්තියක් ඉදිරියේ දැක්වේ. ඒ තුළින්,



1. පැරණි භාරත සමාජයේ විවිධ ඇදහීම් සහ සංකල්ප තිබූ බවට තොරතුරු හමුවේ.
2. විවිධ මාධ්‍ය උපයෝගී කර ගනිමින් මානව රූ සජීවී ප්‍රමාණයට නිර්මාණය කිරීමේ හැකියාව පැරණි මානව යාට තිබූ බව පසක් වේ.
3. ලෝකඩ මාධ්‍ය තුළින් කුඩා මානව රූ තැනීම පිළිබඳවත්, ලෝහ තාක්ෂණය පිළිබඳ දැනුමත් එකල මානවයාට තිබූ බව පැහැදිලි ය.
4. දේව සංකල්පය මෙන්ම විවිධ ඇදහීම් ද මොහෙන්ජෙදාරෝ ශිෂ්ටාචාරයේ තිබූ බව පැහැදිලි වේ.
5. වසර දහස් ගණනකට පෙර ජනතාව තුළ නර්තනය පිළිබඳ  තිබූ දැනුම ප්‍රකට වන  බවට මතයකි. (......)

24) යුගයෙන් යුගය විකාශනය වූ බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ උච්ච අවස්ථාවක් ඉදිරියේ ඇති බුද්ධ ශීර්ෂය තුළින් නිරූපණය වේ. එය.



1. පොත්ගුල් විහාර භූමිය ආශ්‍රිතව හමු වූ බුද්ධ ප්‍රතිමාවකි.
2. මාළිගාවිල පුද බිමෙන් හමු වූ බුද්ධ ප්‍රතිමාවකි.
3. මථුරා කලාවෙන්, ගාන්ධාර කලාවේත් සම්මිශ්‍රණයක් ලෙසින් භාරත දේශයේ නිමැ වූ බුද්ධ ප්‍රතිමාවකි.
4. මහායාන ලක්ෂණ ද සහිතව පොළොන්නරු ගල් විහාර භූමියේ දැකිය හැකි බුද්ධ ප්‍රතිමාවකි.
5. ලඹතටුව උපයෝගී කර නිමින් නුවර යුගයේ මූර්ති ශිල්පියා කළ විශිෂ්ට නිමැයුමකි. (......)

25) පොළොන්නරු නටඹුන් අතර හමුවන විශිෂ්ට සෙල්මුවා මූර්තියක් ඉදිරියේ දක්වේ. එහි අත දරා සිටින දෙයින් කියැවෙන්නේ,



1. රාජ්‍යත්වයේ සංකේතය බවට මතයකි.
2. ඉපැරණි මන්ත්‍ර ශාස්ත්‍රය සහිත තල්පතක් බවට මතයකි.
3. ගුරුළුගෝමීන්ගේ පුස්කොළ පොතක් බවට මතයක් පවතී.
4. ගම්වර ප්‍රදානයක් පිළිබඳ දැනුම් දෙන ලියවිල්ලක් බවයි.
5. පොළොන්නරු රාජධානියේ සැලැස්ම සහිත ලියවිල්ලක් බවයි. (......)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ K, L, M, N, O යන රූප සටහන් උපයෝගී කරගන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**


K


L


M


N


O

26) "K" අක්ෂරයෙන් දක්වෙන සිතුවම
1. යුරෝපයේ ආදි මානවයාගේ ගල්වල සිරීම් පිළිබඳ කදිම සාක්ෂයකි.
2. ප්‍රංශයේ ලැස්කෝ ගුහාවේ දැකිය හැකි මළවුන්ගෙන් සංරචනය වේ.
3. ප්‍රංශයේ දොර්දෝන් ගුගා ආශ්‍රිතව දැකිය හැකි කුරුළු දඩයම සිතුවමයි.
4. ක්‍රි. පූර්ව 140000ට පමණ අයත් ස්පාඤ්ඤ ලෙනක වූ සත්ව රූ අධ්‍යයනය පිළිබඳ සිතුවමකි.
5. සත්ව ලේ සහ විවිධ ස්වභාවික වර්ණ යොදා ගනිමින් ෂෝවෙ ගුහාව තුළ කළ සිතුවමකි. (......)

27) "L" අක්ෂරයෙන් දක්වෙන්නේ,
1. කොළඹ යුගයේ විශිෂ්ට චිත්‍ර ශිල්පියෙකු වූ ජෝර්ජ් කිට් ශිල්පියාගේ නායිකා නැමැති සිතුවමකි.
2. ඝණිකනාදී ශිල්ප ක්‍රම උපයෝගී කරගනිමින් කොළඹ යුගයේ චිත්‍ර ශිල්පියෙකු නිර්මාණය කළ 'කැන්ඩියන් කුමාරි' නැමැති සිතුවමයි.
3. රිද්මයානුකූල රේඛා භාවිතයත්, සරළ හැඩතල සංරචනයක් තුළින් කාන්තා මුහුණේ සුන්දරත්වය පිළිඹිබු කළ නිර්මාණයකි.
4. ඇක්රලික් සායම් මාධ්‍ය උපයෝගී කරගනිමින් කැන්වසයක් මත ජෝර්ජ් කීට් ශිල්පියා කළ අගනා සිතුවමකි.
5. විදේශීය ආභාසයත් ගුරුකොට ගනිමින්, විවිධ අත්හදා බැලීම් කරමින්, දේශීය අනන්‍යතාව ලොවට හෙළි කළ ඝණිකනාදී නිර්මාණයකි. (......)

28) ඉන්දීය ජාතික චිත්‍ර ශිල්පියෙකුගේ ප්‍රසිද්ධ නිර්මාණයක් 'M' අක්සරයෙන් දක්වේ. එය,
1. ජෙමිනි රෝයි නැමැති ශිල්පියාගේ 'යුවතිය' නමැති සිතුවම වේ.
2. අම්රිතා ශර්ගිල්ගේ කාන්තාවෝ නමැති සිතුවමේ කොටසක් වේ.
3. නන්දලාල් බෝස් ශිල්පියාගේ රාධාගේ විරහව නමැති සිතුවමෙන් උපුටා ගත් කොටසකි.
4. රබීන්ද්‍රනාත් තාගොර් පඬිවරයා අතින් නිමැවූ සිතවමකි.
5. අබනීන්ද්‍රනාත් තාගෝර් ශිල්පියාගේ 'භාරත මාතා' නැමැති සිතුවමකි. (......)

29) "N" අක්ෂරයෙන් දක්වෙන්නේ චිත්‍ර කලවේ විශාල පෙරළියක් කළ සිත්තරෙකුගේ නිර්මාණයකි. එය
1. ජු ආන් ග්‍රී නමැති ඝණිකවාදී සිත්තරාගේ කාන්තා උඩුකය සිතුවමකි.
2. පැබ්ලෝ පිකාසෝ ශිල්පියාගේ කාන්තාවකගේ හැඟීම් ප්‍රකාශනය නිරූපිත ඝණිකවාදී සිතුවමකි.
3. ඝණිකවාදයේ උච්ඡතම අවස්ථාවේ ජෝර්ජ් බ්‍රාක් ශිල්පියා කළ තෙල් සායම් චිත්‍රයකි.
4. විකෘති හැඩතල භාවිත කරමින් 19 වන සියවසේ ජීවත් වූ ප්‍රංශ ජාතික සිත්තරෙකුගේ චිත්‍රයකි.
5. ප්‍රංශ සැලොනය ප්‍රතික්ෂේප කළ සිතුවම් සම්ප්‍රදායකට අයත් නූතන යුගයේ ශිල්පියෙකුගේ නිමැවුමකි. (......)

30) 'O' අක්ෂරයෙන් දක්වෙන්නේ,

1. දෙල්මඩ සිත්තර පරම්පරාව විසින් සුවිසල් ගල් ලෙනක් තුළ අඳින ලද ලෙන් විහාර සිතුවමකි.
2. අබණ්ඩ කථන ක්‍රමය උපයෝගී කර ගනිමින් මහනුවර යුගයේ කළ ලෙන් විහාර සිතුවමකි.
3. පාර්ශවගත බව, ද්විමාන බව ආදී ලක්ෂණයන්ට මුල්තැනක් දෙමින් මහනුවර දළදා මාළිගය තුළ කරන ලද විශිෂ්ට සිතුවමකි.
4. දඹුලු විහාර ලෙන් සංකීර්ණ තුළ දැකිය හැකි සිතුවමකි.
5. විද්‍යාධර ගුහා අභ්‍යන්තරයේ, ටෙම්පරා ක්‍රමය භාවිත කරමින් අඳින ලද සංකීර්ණ සිතුවමක කොටසකි. (......)

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට හිමි අංකය තිත් වරහන මත ලියන්න.**

31) උපස්ථිතිවාදයේ අග්‍රගණ්‍ය ශිල්පියෙකුගේ නිර්මාණයක්, බාත් ටබ් හෙවත් නාන බේසම ලෙසට හඳුන්වා ඇත. එය නිර්මාණය කරන ලද්දේ,

1. ක්ලෝඩ් මොනෝ ය.
2. එඩුවඩ් මනේ ය.
3. කමිල් පිසාරෝ ය.
4. ඇල්ෆ්‍රඩ් සිස්ලි ය.
5. එඩ්ගා ඩෙගා ය. (......)

32) ''අං සහිත දෙවියා'' නමැති ස්ටිටයිට් පාෂානයෙන් කළ කුඩා මුද්‍රාවක් හමු වී ඇත්තේ,

1. යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගාධරයේ බිහි වූ බැබිලෝනියානු ශිෂ්ටාචාරයෙනි.
2. ඉන්දු ගංගාව ආශ්‍රිතව බිහි වූ පැරණි ශිෂ්ටාචාරයෙනි.
3. නයිල් ගඟ ආශ්‍රිතව එම නිම්නයේ තිබූ පුරා වස්තු අතුරිනි.
4. හොවැංගෝ ගංගාධාරයේ බිහි වූ ඉපැරණි ශිෂ්ටාචාරයෙනි.
5. ගංගා නම් ගංගාව ආශ්‍රිතව බිහි වූ පැරණි ශිෂ්ටාචාරයෙනි. (......)

33) මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායේ විශිෂ්ට සිතුවම් රැසක් ශ්‍රී ලංකාවේ දකුණු දිග ප්‍රදේශයේ හමු වේ. සිවි ජාතකය - අරිට්ඨපුර සිවි රජතුමා' නැමැති විශිෂ්ට සිතුවම හමුවන්නේ,

1. කුමාරකන්ද රජ මහා විහාරයෙනි.
2. කතළුව පූර්වාරාම රජ මහා විහාරය තුළිනි.
3. මුල්කිරිගල රජ මහා විහාරයෙනි.
4. තෙල්වත්ත රජමහා විහාරයෙනි.
5. කරගම්පිටිය සුබෝධාරාම විහාරයෙනි. (......)

34) පනාවිටිය අම්බලමේ දැකිය හැකි විශිෂ්ට දුව කැටයම් පෙළක් වන්නේ,

1. හේවායා, නයි දඟරය සහ බිනර මල
2. ආචාර සමාචාර, හේරුණ්ඩ පක්ෂියා, රබන් වයන්නා
3. කිඳුරා, මල්ලව පොරය, නෙළුම්මල
4. මල්ලව පොරය, නලඟන සහ බෙරකරු, නයි දඟරය
5. දරුවෙකුට කිරිදෙන මව, සහ දරුවා (......)

35) තිස්ස රණසිංහ මහතා කොළඹ යුගයේ සිටින විශිෂ්ට මූර්ති ශිල්පියෙකි. ඔහුගේ නිර්මාණ වන්නේ,

1. සෙනරත් පරණවිතාන උඩුකය මූර්තිය, තපස, දුෂ්කරක්‍රියා කරන බෝධිසත්ත්වයෝ
2. තාපස, දුෂ්කර ක්‍රියාව, අපායේ දොරටු
3. රජ සහ බිසව, වැතිරගත් කාන්තාව, අම්පිටිය සෙමනේරිස් දූවමය මූර්තිය
4. ජෙසුයිට් පල්ලියේ මූර්තිය, පරණවිතාන ශූරීන්ගේ උඩුකය මූර්තිය, කාලයිස් හි පුරවැසියෝ
5. පවුල, වැතිරගත් කාන්තාව, මව සහ දරුවා (......)

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුරු තෝරා තිත් ඉරි මත ලියන්න. ඒ සඳහා පහත දැක්වෙන ඡායාරූව උපයෝගී කර ගන්න.**



36) මෙම ඡායාරූවේ ඇති සිතුවම දැකිය හැක්කේ
1. රණස්ගල්ල විහාර තුළයි.
2. පැරණි කැළණි විහාරගෙය තුළ ය.
3. මැද්දෙපොළ රජ මහා විහාරය තුළ ය.
4. කුමාරකන්ද විහාරය තුළ ය.
5. නව කැලණි විහාර ගෙය තුළ ය. (......)

37) මෙම සිතුවම ඇඳි ශිල්පියා වන්නේ,
1. දෙවරගම්පළ සීලවතැන්න ය.
2. සෝලියස් මෙන්ඩිස් ය.
3. නීලගම පටබැද්ද ය.
4. ස්ටැන්ලි අබේසිංහ
5. ජෝර්ජ් කීට් ය. (......)

38) මෙම සිතුවම සංරචනය කිරීමේදී ශිල්පියා
1. වංග කලා ආභාසයත්, අජන්ත සිතුවම්වල කලා ලක්ෂණත් පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා.
2. දිගටි මානව රූ යෙදීම සහ කැඩි රේඛා යෙදීම පිළිබඳ අවධානය වැඩියෙන් යොමුකර ඇත.
3. තාත්වික සංරචනයේත්, ව්‍යුක්තරූපික සංරචනයේත් ක්‍රම ශිල්ප පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත.
4. සංගත වර්ණ මාලාව සහ රමනීය රේඛාකරණය තෙත බදාමය සහිත බිතු තලය මත මනාව හසුරුවා ඇත.
5. පෙරබිම සහ පසුබිම පූර්ණ වශයෙන් ප්‍රයෝජනයට ගනිමින් ද්විමාන හැඩතල බහුලව යෙදීමට පෙළඹී ඇත. (......)

39) මෙම සිතුවමේ ශිල්ප ක්‍රම පිළිබඳව සැලකීමේ දී
1. ශිල්පියා ඝණ පින්සල් පහරවල් තුළින් මානව රූපවල ත්‍රිමාණ ලක්ෂණ පෙන්වීමට ශිල්ප ක්‍රම අනුගමනය කර ඇත.
2. පදාස ක්‍රමයට වර්ණ යොදමින් විසංගත වර්ණ තුළ ඇති චමත්කාරය දක්වීමට උත්සාහ ගෙන ඇත.
3. ටෙම්පරා ක්‍රමයට විහාර බිතුතලය තුළ තෙල් සායමින් බුදු සිරිතේ විවිධ සිද්ධි නිරූපණය සඳහා සියුම් රේඛාකරණය යොදා ඇත.
4. ඇතැම් තැන්වල රූප සංරචනයේ දී සංගත වර්ණ ද වියළි බදාමයේ ඇතැම් ස්ථානවල විවිධ ශිල්ප ක්‍රම මගින් පින්සල් පහර යොදමින් ද නිර්මාණය කර ඇත.
5. චූල සම්ප්‍රදායේ ශිල්ප ක්‍රමත්, මහා සම්ප්‍රදායේ ශිල්ප ක්‍රමත් භාවිත කරමින් තමාටම ආවේණික ශෛලියකින් සිතුවම් නිමකර ඇති බව පෙනේ. (......)

40) මෙම සිතුවම් සඳහා තේමා වී ඇත්තේ,
1. ජාතක කතාවලට අදාළ විවිධ සිද්ධි සමුදායයකි.
2. 18 වන සියවසෙහි පැවති ආගමික තත්ත්වයන් පිළිබඳව විවරණයකි.
3. වෙසතුරු සිරිත සහ විහාර කර්මාන්තයට දායක වූ පිරිසක් ආලේඛ්‍ය පිළිරූය.
4. සිදුහත් කුමරුගේ ශිල්ප දක්වීමේ සිට බුද්ධත්වය දක්වා බුදු සිරිතේ විවිධ සිද්ධීන්ය.
5. බුදු සිරිතේ විවිධ සිද්ධීන් මෙන්ම බුදු දහම හා සබැඳි විවිධ ඓතිහාසික සිද්ධීන්ය. (......)

# <u>ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය</u>

## 12 ශ්‍රේණිය - චිත්‍ර කලාව I

## II - කොටස

- **මෙම කොටස කොටස් තුනකින් යුක්තය.**
- **එක් කොටසකින් ප්‍රශ්නයක් බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**
  **(අවශ්‍යතැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක විය හැකිය.)**

### 'අ' කොටස - චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව

01. අතීත ශ්‍රී ලංකාව තුළ ඇති සම්භාව්‍ය චිත්‍ර කලාවක් තිබූ බවට හමු වී ඇති සිතුවම් සමූහයක සාක්ෂි දරයි.
    1. අනුරාධපුර යුගයේ සිතුවම් හමුවන ස්ථාන දෙකක් නම් කරන්න.
    2. පොළොන්නරුවේ තිවංක පිළිම ගෙය තුළ දැකිය හැකි සිතුවම් තුනක් පිළිබඳව ඇගයීමක් කරන්න.
    3. 'මහනුවර යුගයේ සිතුවම් කලාව තුළ පහතරට සම්ප්‍රදායේ සිතුවම්වලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. කතළුව විහාරයේ සහ මුල් කිරිගල විහාරයේ සිතුවම් ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාව යුගයෙන් යුගය වෙනස්කම්වලට භාජනය වීමෙන් පසු මහනුවර යුගය වන විට වෙනස්කම් රාශියක්ම දැකිය හැකි විය.
    1. අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමා හතරක් නම් කරන්න.
    2. පොළොන්නරු ගල් විහාර ප්‍රතිමා පෙළ හෙළ සෙල් වඩුවාගේ ප්‍රතිභාව පෙන්වන හොඳම නිදසුනක් වේ. ගල් විහාර ප්‍රතිමා සතරෙහි ශිල්ප ක්‍රම ශෛලිය ආදිය පැහැදිලිවන සේ ඇගයීමක් කරන්න.
    3. ගම්පොළ මහනුවර යුගය වන විට බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ දී සුවිශේෂී වෙනස්කම් දැකිය හැකිවිය. ගලාදෙණිය විහාරය, දඹුල්ල විහාරය හා ආශ්‍රිත බුද්ධ ප්‍රතිමා ඇසුරු කරගනිමින් ඉහත නියමන සනාථ කරන්න.

### 'ආ' කොටස - චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව

03. ලොව බුද්ධ ප්‍රතිමාවේ ඇරඹුම ගන්ධාරව බව විද්වත් මතය වන අතරථ මථුරාවෙන් බිහි වූ බුද්ධ ප්‍රතිමාව ද කලා ලක්ෂණවලින් පිරිපුන් ය.
    1. ගාන්ධාර කලාවේ හමුවන බුද්ධ ප්‍රතිමා හතරක් නම් කරන්න.
    2. ඉන් දෙකක් පිළිබඳ කලා ලක්ෂණ ද පිළිබිඹු වන සේ ඇගයීමක් කරන්න.
    3. මථුරා හිටි පිළිමයක්, සාරානාත් හිඳි බුද්ධ ප්‍රතිමාවත් භාරත මූර්ති කලාවේ මහිමය ලොවට කියාපායි. මෙම ප්‍රතිමා දෙක පිළිබඳ ඇගයීමක් කරන්න.

04. රාජ්පුත් සහ මෝගල් සිතුවම් කලාව සමකාලීන වූවත් යම් යම් වෙනස්කම් ඒ තුළ දැකිය හැකි විය.
    1. රාජ්පුත් චිත්‍ර කලාවේ හමුවන ප්‍රසිද්ධ චිත්‍ර හතරක් නම් කරන්න.
    2. ඉන් වඩාත් ප්‍රසිද්ධ සිතුවම් දෙකක් පිළිබඳ ඇයීමක් කරන්න.
    3. ''මෝගල් සිතුවම් කලාව තුළ ද සුවිශේෂී ලක්ෂණ දැකිය හැකිය'' මෝගල් සිතුවම් තුනක් නිදසුන් ලෙස ගනිමින් ඉහත කියමන සනාථ කරන්න.

**'ඉ' කොටස - චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය**

05. පුනරුද සමය ප්‍රභාමත් කළ නිශිෂ්ට චිත්‍ර සහ මූර්ති ශිල්පීන්ගේ නිර්මාණ ලොව අමරනීය වේ.

1. රෆාපල් සන්සියෝ ශිල්පියාගේ සිතුවම් දෙකක් නම් කරන්න.
2. ලියනාර්ඩෝ ඩාවින්ඩි (සි) මෙම යුගයේ බිහි වූ මහා කලා විශාරදයා වේ. ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ දෙකක් පිළිබඳ ඇගයීමක් කරන්න.
3. ''මයිකල් ඇන්ජිලෝ චිත්‍ර කලාවට මෙන්ම මූර්ති කලාවට ද එක සේ දස්කම් දැක් වූ අයෙකි. ''ඔහුගේ ප්‍රසිද්ධ මූර්ති තුනක් ඇසුරෙන් කියමන සනාථ කරන්න.

06. ඡායානුවාදය හෙවත් ප්‍රශ්චාත් උපස්තිථිවාදය සිතුවම් කලාවේ පෙරළියක් කළ එක්තරා සන්ධිස්ථානයකි.

1. පෝල් සෙසාන් ශිල්පියාගේ ප්‍රසිද්ධ සිතුවම් දෙකක් නම් කරන්න.
2. පෝල් ගොගැන් ශිල්පියා තහිටි ජන ජීවිතය ඇසුරුකර ගනිමින් අඳින ලද සිතුවම් තුනක් පිළිබඳ විස්තරයක් කරන්න.
3. ''වින්සන්ට් වැන්ගෝගේ සිතුවම් තුළ දැකිය හැකි වූයේ නවකතාවකි.'' ඔහුගේ ප්‍රසිද්ධ සිතුවම් තුනක් ඇසුරු කර ගනිමින් විස්තරයක් කරන්න.

**13 ශ්‍රේණිය - චිත්‍ර කලාව**

**III - පත්‍රය**

**I - කොටස**

**කාලය පැය 3**

- **'අ' කොටස හෝ 'ආ' කොටස හෝ 'ඉ' කොටස තෝරා ගන්න.**
- **ඔබේ නම/විභාග අංකය චිත්‍රය පසුපස පැහැදිලිව සඳහන් කරන්න.**
- **චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතුය. (දිය සායම් චිත්‍රයක් නම්)**
- **ඕනෑම වර්ණ මාධ්‍යක් භාවිතා කළ හැකිය.**
- **මෝස්තර ඇඳීමේදී ජ්‍යාමිතික උපකරණ, ටිෂු කඩදාසි භාවිතා කළ හැකිය.**

---

- **පහත සඳහන් තේමාවන්ගෙන් එකක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.**

**'අ' කොටස - චිත්‍ර සංරචනය**

01. ගම්බද පිහිටි හේනක අස්වනු නෙලන පිරිසක්.

02. ආගමික ස්ථානයක වතාවත්වල යෙදෙන බැතිමතුන්

03. ගල් කුළු සහිත කඳුකර පෙදෙසක සැරිසරණ ගවයන් සහ එළුවන්

**'ආ' කොටස - මෝස්තර නිර්මාණය**

01. පරිසරයේ දැකිය හැකි මල සහ කොළ ආශ්‍රයෙන් දොර රෙද්දකට සුදුසු මෝස්තරය ඇඳ වර්ණ කරන්න.

02. අට පට්ටම් හැඩයේ ටිපෝවකට සුදුසු ව්‍යුක්ත රූපික හැඩතල සහිත ටීපෝ රෙද්දක් ඇඳ වර්ණ කරන්න.

03. පැරණි සරසිලි මෝස්තර කීපයක් භාවිතා කරමින පතාකයක් නිර්මාණය කර වර්ණ කරන්න.

**'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය**

01. ''වසන්ත උදාවිය'' නමැති නවකතා පොතකට සුදුසු පිටකවරක් ඇඳ වර්ණ කරන්න.

02. ''ඩෙංගු මාරාන්තිකයි' යන්න තේමා කර ගනිමින් වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න සුදුසු පරිදි අක්ෂර යොදන්න.

03. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනු පා තබ තබා
කම් පසේ දෙන සැර ලෙසේ දෙස බල බලා නෙතඟින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟ සොබා
මෙම කවිය සඳහා සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 13 ශ්‍රේණිය - චිත්‍ර කලාව II
## III - කොටස

**සිසුන් සඳහා උපදෙස් :-**

- **පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන/ ඔබ ඉදිරියේ ඇති ද්‍රව්‍ය කට්ටලය ඇඳ වර්ණ ගන්වන්න.**

  - කඩදාසි තලය අර්ථවත්ව භාවිතා කර සම්පිණ්ඩනය කරන්න.
  - ද්‍රව්‍යවල ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක රීති.
  - ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
  - වර්ණ මාධ්‍ය හැසිරවීම හා ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිතා කරන්න.
  - මාධ්‍ය මිශ්‍රව භාවිත කළ හැකිය.
  - ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට උචිත ලෙස වෙනස් කළ හැකිය.
  - සුදුසු වර්ණයන් සහ ශිල්ප ක්‍රම භාවිතා කරන්න.